# යුරෝපා ඉතිහාසය

## 5.1.2
## ප්‍රථමයෙන් ම එංගලන්තය තුළ කාර්මික විප්ලවය ආරම්භ වීමට බලපෑ හේතු



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## කාර්මික විප්ලවය ප්‍රථමයෙන් ම බ්‍රිතාන්‍යය තුළ ඇති වීමට බලපෑ හේතු

දහ නවවන සියවසේ අගභාගයේ දී පමණ මුලින් ම බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ විය. එතැන් සිට අඩ සියවසක් පමණ ම කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයට සීමා වී තිබුණි. ඊට පසු යුරෝපයේ වෙනත් රටවල ව්‍යාප්ත විය. කාර්මික විප්ලවය මුලින්ම බ්‍රිතාන්‍යයේ ඇති වීමට බලපෑ සුවිශේෂී හේතු ගණනාවක් හඳුනාගත හැකි ය.

* ජනගහනය අධික වීම
* 14-15 සියවස්වල යුරෝපයේ ඇති වූ පුනරුදය හා විද්‍යාත්මක දැනුම නිසා යන්ත්‍ර සූත්‍ර නිපදවීම
* යකඩ හා වානේ, ගල් අඟුරු වැනි ස්වාභාවික සම්පත් බහුල වීම
* යටත් විජිත නිසා පුළුල් වෙළඳ පොළක් බිහිවීම
* ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය
* නිදහස් සමාජ පසුබිම
* බැංකු හා මූල්‍ය ආයතන බිහිවීම
* දේශපාලන ස්ථාවරත්වය
* කුඩා දිවයිනක් වීම
* රටපුරා විහිදුණු පොදු වෙළෙඳපොළ
* වැඩවසම් ක්‍රමය බිඳ වැටීම

මෙම කාලය තුළ බ්‍රිතාන්‍යයේ ජනගහනය ඉතා අධික විය. මරණ අනුපාතය ශීඝ්‍ර ලෙස අඩු වීම ජනගහනය වැඩි වීමට හේතුවක් විය. වැඩිවන ජනගහනය නිසා භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම අධික විය. රට තුළ භාණ්ඩ නිෂ්පාදනය වේගවත් කිරීමට සිදුවීම කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට ද හේතුවක් විය.

14-15 සියවස්වල යුරෝපයේ ඇති වූ පුනරුදය නිසා නව සොයා ගැනීම් ක්ෂේත්‍රයේ ද පිබිදීමක් ඇති විය. එම දැනුම භාවිතයට ගැනීමට බ්‍රිතාන්‍යයට හැකි විය. එසේම යන්ත්‍ර සූත්‍ර සෑදීමට වුවමනා කරන්නා වූ සම්පත් ද බ්‍රිතාන්‍යයේ පැවතිණි. නව නිපදවීම් නොවන්නට කාර්මික වර්ධනය ඉතා සෙමින් සිදුවන්නට ඉඩ තිබුණි.

බ්‍රිතාන්‍යය සතුව බහුලව සම්පත් ද තිබුණි. යකඩ, වානේ , ගල් අඟුරු සම්පත් බ්‍රිතාන්‍යයේ ව්‍යාප්තව තිබුණි.ගල් අඟුරුවාෂ්ප බලය විශාල පරිමාණයේ නිෂ්පාදනවලට ඉන්ධන හා බලය සැපයිණි.





අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )

Copyright © www.e-thaksalawa.moe.gov.lk

යටත් විජිත සමූහයක් බ්‍රිතාන්‍ය සතු විය. හිරු නොබසින අධිරාජ්‍යය ලෙස ලොව ප්‍රසිද්ධ වූ බ්‍රිතාන්‍යය සතුව ලෝකය පුරා ව්‍යාප්තව පැවැති යටත් විජිත සමූහයක් විය. ඔවුන්ට අවශ්‍ය භාණ්ඩ ආනයනය කරණු ලැබුවේ ද බ්‍රිතාන්‍යය විසින් ම ය. කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපදවනු ලැබූ අතිරික්ත භාණ්ඩ සඳහා වෙළෙඳ පොළක් යටත් විජිත නිසා බ්‍රිතාන්‍යයට හිමි වීම වක්‍රව කාර්මික විප්ලවයට මඟ පාදා දෙනු ලැබී ය.

**ඉඩම් කොටු කිරීම යනු,**

ඉඩම් හිමියන් විසින් සුළු ගොවියන් සතු වූ කුඩා ඉඩම් කැබලි එකතු කර විශාල ගොවිපළවල් සකස් කරන ලදී .මෙම වැඩ පිළිවෙළ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය ලෙස හඳුන්වයි.

13 වන සියවසේ සිට ම ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නොකඩවා සිදුවෙමින් පැවතිණි. ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වුවකි. මෙම ක්‍රියාවලිය බිම් අයිතිය පෙරට වඩා ස්වල්ප දෙනෙකු තුළ කේන්ද්‍ර ගතවීමට හේතු විය.ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා බොහෝ දෙනෙකුට කෘෂි කර්මයෙන් ඈත් වීමට සිදු විය. මෙසේ කෘෂි කර්මයෙන් ඈත් වූ අයට වෙනත් කටයුතුවල යෙදීමට නිදහස ලැබුණි. මෙය කාර්මික විප්ලවය ඇති වීමට හේතුවක් විය. ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා රැකියා අහිමිවූවන් රැකියා සොයා නගරයට සංක්‍රමණය විය. මෙය ශීඝ්‍ර ලෙස සංවර්ධනය වෙමින් පැවති කාර්මික ක්ෂේත්‍රයේ ශ්‍රම ඉල්ලුම ඉටු කිරීමට ප්‍රබල පිටුවහලක් විය.

සෙසු රටවල්වල මෙන් නොව බ්‍රිතාන්‍යය තුළ සමාජ තරාතිරම කුමක් වුවත් හැකියාව ඇති අයට ධනය උපයා ගැනීමට හැකි පසුබිමක් තිබුණි. ආකල්පමය වශයෙන් එරට පැවති මෙම නිදහස් සමාජ පසුබිම කාර්මික විප්ලවයේ වර්ධනයට වක්‍රව බලපෑ හේතුවක් විය.

දහඅටවන සියවසේ මුල් කාලයේ දී ඉඩම් හිමියන් තම අතිරික්ත ධනය කොටසක් ණයට දීමට පෙලඹිණි. නැති නම් රේන්ද පොළ සමාගමක කොටස් මිල දී ගැනීම සඳහා ආයෝජනය කරන ලදී. බ්‍රිතාන්‍ය සමාජය තුළ බැංකුකරුවන් ව්‍යාප්ත වීමත් සමඟ ඉතිරි කිරීම් හා ණය දීම් ක්ෂේත්‍රය වර්ධනය වූ අතර එය කාර්මික ආයෝජනයන් වැඩි වීමට හේතුවක් විය. එහි ප්‍රතිඵලය කාර්මික විප්ලවයේ වර්ධනයට බලපෑම් ඇති කරන ලදී. බැංකු මඟින් කාර්මික විප්ලවයට කළ ප්‍රධානතම බලපෑම කෙටි කාලීන මුදල් එකතු කර, ඒවා ප්‍රාග්ධන ඉල්ලුම අධික ප්‍රදේශවලට මාරු කිරීම යි.

බ්‍රිතාන්‍යය සතුව පැවති දේශපාලන ස්ථාවරත්වයද කාර්මික වීප්ලවය වර්ධනයට බලපෑ ප්‍රධාන සාධකයක් විය. මෙම කාලයේ පුරාණ වරප්‍රසාද හා ඒකාධිකරණය ඉවත හෙලන ලද අතර ව්‍යවසායකයන් ආරම්භ කිරීමෙහි ලා ව්‍යවස්ථාදායකයෙන් ඇති වූ බාධා ද ඉවත් කරන ලදී. රාජ්‍ය අඩු වශයෙන් ද පුද්ගලයින් හා සමාගම් වැඩි වශයෙන් ද කාර්යයන්හි යෙදෙන ලදී. මෙසේ බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලනික නිදහස් වාතාවරණය කාර්මික විප්ලවයට මඟ පාදන ලදී. මෙමඟින් නිදහස හා බදු සහන ලැබීම කර්මාන්ත සංවර්ධනයට මහත් අනුබලයක් විය.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
Copyright © www.e-thaksalawa.moe.gov.lk

බ්‍රිතාන්‍යය කුඩා රටක් වීම, දූපතක් වීම මෙන් ම රට තුළ ව්‍යාප්ත වූ යටිතල පහසුකම් සමුදාය විශේෂයෙන් මාර්ග, ජලය නව කර්මාන්ත ආරම්භ වීමට මනා පිටුවහලක් විය.දූපතක් වීම ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පුළුල් කර ගැනීමට පහසුවක් විය. (වරායන් ,පිහිටුවා ගැනීමට පහසු විය.) එසේම රටපුරා ව්‍යාප්ත වූ වෙළෙඳ පොළ නිෂ්පාදන භාණ්ඩ අලෙවියට පහසුවක් විය.



දහනව වන සියවස වන විට බ්‍රිතාන්‍යයේ වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටී තිබුණි. මෙමගින් බ්‍රිතාන්‍ය සමාජයේ ඇති වූ වෙනස්කම් කාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයට බෙහෙවින් ඉවහල් විය. වැඩවසම් ක්‍රමය බිඳ වැටීමත් සමග නිෂ්පාදන සාධක සංචලනයත් ස්වයංපෝෂිත බව නැතිව යාමත් කාර්මික භාණ්ඩ අලෙවියට හිතකර පසුබිමක් ගොඩ නැගුණි. ප්‍රවේණි දාසියන්ගේ විමුක්තිය උදා වීම නිසා ශ්‍රමය නිදහස් වීම, ඒකාධිකාරය ලිහිල් වීම, තරගය වර්ධනය වීම , ශ්‍රේණි ක්‍රමය බිඳ වැටීමත් නිසා කාර්මික වර්ධනය ඉක්මන් විය. මේ සියලු කාරණාවල මිශ්‍රණය බ්‍රිතාන්‍ය කාර්මික විප්ලවය බිහිවීමට මඟ පාදන ලද බව කිව හැකි ය.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
Copyright © www.e-thaksalawa.moe.gov.lk